

## ....සිහිනවලින් ලේ ඇවිත්....

**ප්‍රනීත් කාරියවසම්**

පාමුල හිඳිමින්
ඔබගේ
දෑත් එක්කොට

යලි යලිත්
හ න්නට
අවකාශ නොවෙයි
ඔබ සමුගෙන
ගිහින්

මා හට නිදි නොඑයි
අදවත්
මතුනම් කිසිලෙසකත්
සිහින නොදකිම්
නැවතත්
අදින් පසු

මොහොතකටවත්
කෙසේදෝ පිසලන්නේ
ගැලු ලේ බිඳු
එකිනෙක පරයා
නැගෙනා

දහඩිය බිඳු
සමගින්




## අම්මා

**උමේෂ් ඉෂාර**

කතරෙ මග නොව එතෙර වන්නට
කතරෙ සිට මට එතෙර හුරු කල
සසරෙ සුන්දර සෙනෙහෙ පිරි සිත
ප්‍රථම බඹු අම්මා

උතුර උතුරා දුක ගලද්දී
පතුර පතුරා සෙනෙහෙ මල් මී
මතුර මතුරා පුතුගෙ නාමය
දුක දුබල කල අයුරු සොඳුරුය

වපුර වපුරා සිතේ ක්ලේෂය
මිතුර සතුරා ලෙසට වද්දී
මතුර මතුරා පුතුගෙ නාමය
හොඳම මිතුරා මවම මට විය

## අතහැරෙන කුළුදුල් මලට

**රාජිකා හර්ශණී**

ළහිරු ආදර කිරණ වැදී සිත් ළදල්ලට
පිපුණු මල් කැකුළ නුඹ තුරු හිසේ කුළුදුලට
රුහිරු රොන්සුනු පෙව්වෙ ඊයෙ වාගෙයි මලට
අකුරු ඇහිදින්න අද ගියයි මල සිප් හලට

පස් වසක නුඹේ හීන මැවූ දුප්පත් උයන
හිස් කටුක මුඩු බිමව පෙනේවිද ඉදිරි දින?
ඉස්කොලෙ නව විමන මවන අරුමැසි සිහින
විස්සෝප ඒ නිසයි අත හරින්නට ලොබින

මලක් නම් සුවඳ හැඩ ගහට නොව ලොවට දෙන
හෙටක් එයි හිත පැතූ බඹරු නුඹ කැටුව යන
ඉරක් මල ගැන සොවින් කඳුළු මුහුදේ ගිලෙන
දිනක් ඇත ගස් වැලුත් පිණි කඳුළු වැල් සලන




## සනාතන අරගලය

**ප්‍රේමවංශ දසනායක**

බුදු රදුන් වැඩ හිඳුනු
එදා යට ගිය දවස
බුදුනුවන් පෙළ ගැසුනු
මෙදා නූතන දවස

ඉර යටින් හඳ යටින්
දිග හැරෙන හැම දවස
මතු කරන දර්ශනය
නැත වෙනස කිසි දවස

දිලිඳු බව සමෘධිය
කාසියේ දෙපැත්තය
එකක් නැති කොට අනෙක
රැක ගැනුම කල නොහැක

සියලු ශාස්තෘ වරුන්
පිරුනු කරුණා සිතින්
යුගෙන් යුගයට ලොවට
පහලවී අප පිනට

දිලිඳු බව මකන්නට
දෙසූ බණ දහම් කඳ
ගලා ගොස් හතර වට
සයුර උතුරා ගියද

ලැබූ නැති බැරි කමින්
වෙලී පැටලුනු දනන්
අත් විඳින අරගලය
එදත් අදටත් එකය

එදා ඒ රජ දවස
ඇමති සිටුවරු නොවුන
දිලිඳු රට වැසියන්වූ
කොතෙක් දෙන සිටියෝද

මෙදා ගතවන දවස
නැතිව අත මිට සරුව
ජීවිතය ගැට ගසන
කොතෙක් දෙන සිටින්නොද

## දිව

**ගුණසීලි ජයසුන්දර**

මුව වසා සිටින තුරු - කිසිවකුට හානි නැති
අසංවර අපේ දිව, රස සොයා ලෙඩ වවන
කටේ ඇති කෙටේරිය - දිවට පමණක්ද හැකි
කතාබස් කරන්නට - අම්මාගෙ හද ගැස්ම
තුළින් එන කතාවට - සවන් දී සිඟිති පුතු
නිදන්නේ තුරුල්ලේ

පැටව් තුරුළුට අරන් - හතර ගාතෙන් වසා
මෝටරය වගේ "පුරු - පුරු " ගාන බැළලියක්
දරු සෙනෙන් හදවතින් - පැන නගින කතාවක්
ලෝකයට කියනවා

ස්වාමියා ඉදිරියේ - කෙළෙහිගුණ පෙන්නලා
ගෙදර බලු සුරතලා - උගේ වලිගය වනා
ආදරෙයි කියනවා

තරුණ පෙම් යුවලකගෙ - නෙත් දෙකෙන් කියැවෙනා
පෙම් හැඟුම් පවසන්ට - දිවට සවියක් කොහිද
ඉසුරුමුණි පෙම් යුවල - අදත් පෙම් බස් දොඩති

උයන මහ මෙවුනාවෙ - ලොවම සුවපත් කරන
කතාවක් කියවන්නෙ - කලාකරුවගෙ දෑත

බටලීය සිතාරය වයලීනයත් සමග
වටන ඒ ඇඟිලි තුඩු - නරුන සත්සර හඬින්
සිත් වශී කරගන්ට - කරනවා කතාවක්

දිවෙන් වැඩ සැළසුවේ - බුදු පියාණන් පමණි
ලොවක් දණ ගස්වමින් - මග එලත් ලබා දී
ලොවු තුරා සැප දෙන්ට - බුදු හිමිට හැකි වුණෝ
දිව හසුරුවා දෙසු
උතුම් සද්ධර්මයෙන්
මල් සුවඳ විහිදුනා - ඒ උතුම් බුදු මුවින්

## මෙනුවර

**රත්න ශ්‍රී**

පෙකෙණිවැල දිගේ පැමිණෙන
දුක්ඛ වේදනා අතවර
නිදි විඳින දෑස් කෙළවර
පිළිවෙළට වියයි සිහිනය

ගහ වැල ද මල් ද මුහුද ද
වන ගැබ ද පොකුණු විල්තෙර
වියවුලට නොයා පැටලුණ
සියල් සිත් නිවන පිළිවෙළ

මහ වේ හි බමන රියසක
නාඳුනන මුහුණු අපමණ
වට අවට සියලු අබතුර
පිළිවෙළය එක ම චරිතය
අපිළිවෙළ, දැරූ මා අත
තබන්නෙද කොතැන මේ බිම?

## සදාදරණීය කිවුල ළිඳ ළඟ මංසල

**ඩොමිනික් චන්ද්‍රසාලි**

අහසක් දරාගෙන හුන් මංඩිය
කිවුල ළිඳ ළඟ හන්දිය
ගම රැකි දෙවියන්ගේ
ස්මාරක වඩාගෙන හුන්
සදාදරණීය
කිවුල ළිඳ ළඟ හන්දිය

මාරයාගේ දූතයන් ආ
රාත්‍රිය සිහි කරනා
මාවතේ ඉතිරි වුණ ස්මාරකය
කාලයාගේ ඇවෑමෙන්
සුදු කොඩි නැඟුණේ
මංසලේ හදවතේ පමණ ය

බක්මහ ද ඉලව් ගෙයක් මෙන්
හැමදාම හද ගැහෙන හන්දිය
ගල් අරක්කු බිව්වත්
දැන් එතැන කිවුලය

තණපත් පවා හැකිළිලා
රහසක් දරන් හිත යට
පහනක් පවා ඇවිළුණොත් මංසලේ
කරුණක් තමයි එය මරණයට

ඉස්සර මංසල හරි අවංක ය
දුක් ගින්දර පවා දරන්නේ
ගම්මු එක්ක ම හදවත් වැලඳගෙන ය
නිල නොලත් අවි හංගාගෙන
මංසලත් දැන් එක විදිහක් ය

එක හිතක් නැති මංසල
කිවුල ළිඳ ළඟ මංසල
දුක වුණත් කියන්නෑ කවුරුත්
හුඟ දුරයි දැන් මංසල
ඒ වුණත් උඹ මංසල
කිවුල ළිඳ ළඟ මංසල

*ගාලු පාර දිග හැලුණු සිනා සැළු* 2014

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com